CP/AL/2024/28/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

ගෘහ ආර්ථික විද්‍යාව - I | 28 | S | I | 13 ශ්‍රේණිය

පැය දෙකයි

විභාග අංකය.........................

උපදෙස්: සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. නිර්මාණකරණයේ මූලධර්මයක් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,
   (1) රිද්මය, වයනය හා වර්ණය.
   (2) හැඩය සමානුපාතය හා අවධාරණය.
   (3) වයනය, හැඩය හා රිද්මය.
   (4) රිද්මය, සමානුපාතය හා අවධාරණය
   (5) රේඛා, හැඩය හා රිද්මය. (.......)

2. ගෘහස්ථ ජීවන පරිසරයක් නිර්මාණය කිරීමේදී වැඩි අවධානයක් යොමු කළ යුත්තේ,
   (1) අභ්‍යන්තර අවකාශ නිර්මාණයට හා වටිනාකම් පද්ධතිවලටය.
   (2) නාගරික පරිසර නිර්මාණයට හා අනුකූලත්වයට ය.
   (3) භෞතික පරිසරයට හා සමාජ පරිසරයටය.
   (4) කාල අවකාශ නිර්ණය කිරීම හා නිර්ණායකයන්ට ගැලපීමය.
   (5) සමාජ පරිසරය හා කලාත්මක බවය. (.......)

3. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ස්වභාවික පරිසරයට අනුගතවෙමින් කරනු ලබන නිර්මාණ දාඩ හූ දර්ශන වේ.
   (2) උස බිත්ති සහිත අවකාශයේ තැබීමට දිගින් හා පළලින් වැඩි ගෘහ භාණ්ඩ සුදුසු වේ.
   (3) හූ දර්ශනයට ගැලපෙන ආකාරයට ගමන් කිරීමේ අවකාශ සකස් කිරීම සංසරණය ලෙස හැඳින්වේ.
   (4) කාමරයකට ස්වභාවික ආලෝකය ලබා ගැනීම සඳහා වහලයට පාරභාෂක වීදුරු යෙදීම යෝග්‍යවේ.
   (5) ගොඩනැගිල්ලේ බිත්ති සඳහා සිමෙන්ති ගල් භාවිතා කිරීමෙන් ඇතුළත රත්වීම අඩුකරගත හැකිවේ. (.......)

4. දළදා මාළිගාව අවට ඉදිවන නව නිර්මාණවලදී අවධානය යොමු කර ඇති උපයෝගිතා සාධකය වන්නේ,
   (1) සැකැස්ම හා පිහිටීමය. (2) ප්‍රමාණය හා සමානුපාතික බවය. (3) කලාත්මක බවය.
   (4) අනුකූලත්වය. (5) වටිනාකම් පද්ධතිය ය. (.......)

5. කිරිවල පවතින ඩයිසැකරයිඩය වන ලැක්ටෝස් නිර්මාණය වී ඇත්තේ පහත කුමන මොනසැකරයිඩ දෙක එකතුවීමෙන්ද ?
   A. ග්ලූකෝස් B. ගැලැක්ටෝස් C. ෆෲක්ටෝස් D. සුක්‍රෝස්
   (1) A හා D පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
   (4) C හා D පමණි. (5) B හා D පමණි. (.......)

6. කාබෝහයිඩ්‍රේට මගින් සිරුර තුළ සිදුකරන කාර්යයන් වන්නේ,
   (1) එන්සයිම සෑදීම.
   (2) දේහ උෂ්ණත්වය ආරක්ෂා කිරීම.
   (3) මේද ද්‍රව්‍ය විටමින් පරිවහනය කිරීම.
   (4) අන්ත්‍රයේ ඇති සහජීවී බැක්ටීරියා මගින් විටමින් B නිපදවීම.
   (5) ස්නායු සෛල නිපදවීම. (.......)

7. මේද හයිඩ්‍රජනීකරණ ක්‍රියාවලිය මගින්,
   (1) අත්‍යවශ්‍ය මේද අම්ල ප්‍රමාණය වැඩි වේ.
   (2) ද්විත්ව බන්ධන සංඛ්‍යාව වැඩි වේ.
   (3) ඝන මේද ද්‍රාව්‍ය තත්ත්වයට පත්වේ.
   (4) මුඩු වීම සිදුවේ.
   (5) ස්නායු සෛල නිපදවීම. (.......)

දෙවන පිටුව බලන්න

8. සසුවෙකු වසන් ආහාර නියැදියක් සඳහා සිදුකරන ලද පරීක්ෂණයකට අදාල නිරීක්ෂණ හා නිගමන පහත වගුවේ දක්වා ඇත.

| | පරීක්ෂාව | නිරීක්ෂණ | නිගමනය |
|---|---|---|---|
| A | අයඩින් පරීක්ෂාව | දුඹුරු වර්ණයක් දක්නට ලැබේ. | පිෂ්ඨය අඩංගු නොවේ. |
| B | බෙනඩික් පරීක්ෂාව | නිල් පැහැය ගඩොල් රතු වේ. | ග්ලූකෝස් අඩංගු විය. |
| C | බයියුරේට් පරීක්ෂාව | නිල් දම් පැහැයෙන් ලබාදේ. | ප්‍රෝටීන් අඩංගු නොවේ. |
| D | සුඩාන් III පරීක්ෂාව | රතු ගෝලිකා දක්නට නොලැබේ. | ලිපිඩ අඩංගු නොවේ. |

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) A හා C පමණි. (2) A,B හා C පමණි. (3) A,C D පමණි.
(4) A,B හා D පමණි. (5) ABCD යන සියල්ලම.
(.......)

9. සමහර පුද්ගලයින්ට කිරි හා කිරි ආහාර , ආහාරයට ගැනීමෙන් ආසාත්මික තත්ත්ව ඇතිවීමට හේතු වන්නේ,
(1) ලැක්ටේස් එන්සයිම ක්‍රියාකාරීත්වය අඩුවීම.
(2) මෝල්ටේස් එන්සයිමයේ ක්‍රියාකාරීත්වය අඩු වීම.
(3) සුක්‍රේස් එන්සයිමයේ ක්‍රියාකාරීත්වය අඩුවීම.
(4) ට්‍රිප්සින් එන්සයිමයේ ක්‍රියාකාරීත්වය අඩුවීම.
(5) පෙප්සින් එන්සයිමයේ ක්‍රියාකාරීත්වය අඩුවීම.
(.......)

10. සිරුර තුළ කැල්සියම් වලින් ඉටුවන කෘත්‍යයක් වනුයේ,
(1) ප්‍රතිශක්තිය ලබා දීමය. (2) ලේ කැටි ගැසීමයි. (3) ඔක්සිජන් පරිවහනය
(4) පේශි පටක නිපදවීමයි. (5) ජල තුලනය පාලනය කිරීමයි.
(.......)

11.ආහාරමය තන්තු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) අන්ත්‍රයේ ඇති බැක්ටීරියා, තන්තු මත ක්‍රියාකර දිගු දාම මේද අම්ල සාදයි.
(2) තන්තු මගින් බෝ නොවන රෝග සැදීමේ අවදානම අඩු කරයි.
(3) මල ද්‍රව්‍යවල බර වැඩි කරයි.
(4) මහා අන්ත්‍රයේ පිළිකා සෑදීම අවම කරයි.
(5) මල බද්ධය වළක්වයි.
(.......)

12. විටමින් $B_3$ හා විටමින් $B_7$ රසායනික නාමයන් පිළිවෙලින් ඇති වරණය වනුයේ,
(1) නියසින් හා බයොටින් ය. (2) නියසින් හා පිරිඩොක්සින්ය.
(3) බයොටින් හා තයමින්ය. (4) පිරිඩොක්සින් හා තයමින්ය.
(5) තයමින් හා නයසින්ය.
(.......)

13. තීව්‍ර මන්ද පෝෂණය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ශරීරයේ පරිවෘත්තීය ක්‍රියාවලිය සෙමින් සිදුවේ.
(2) ශරීරය තුළ උෂ්ණත්ව යාමනය බිඳවැටීම සිදුකරයි.
(3) ශරීරයේ සංචිත කරගෙන ඇති කාබෝහයිඩ්‍රේට් ප්‍රථමයෙන් ප්‍රයෝජනයට ගනී.
(4) ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය අඩු කරයි.
(5) මාංශ පේශි ක්ෂය වීම නිසා උසට සරිලන බරෙහි වෙනසක් සිදුවේ.
(.......)

14. ආමාශය තුළ සිදුවන ක්‍රියාවලියක් නොවන්නේ,
(1) ආමාශයේ ඇති ආහාර ආම්ලසයක් බවට පත්වීම.
(2) ප්‍රෝටීන් ජීර්ණය ආරම්භ වීම.
(3) රෙනින් මගින් කිරි කැටි ගැසීම සිදුවේ.
(4) හයිඩ්‍රොක්ලෝරික් අම්ලය මගින් අක්‍රිය එන්සයිම සක්‍රිය කරයි.
(5) ආමාශය තුළදී ඇමයිලේස් ක්‍රියාකාරීත්වය හොඳින් සිදුවේ.
(.......)

15. පිළිවෙලින් ඇමයිලේස්, පෙප්ටයිඩේස් හා රෙනින් යන එන්සයිම මගින් ජීර්ණය සිදුවන ස්ථාන වනුයේ,
(1) ක්ෂුද්‍රාන්තය, ආමාශය හා ග්‍රහණිය. (2) මුඛය, ග්‍රහණිය හා ආමාශය.
(3) ක්ෂුද්‍රාන්තය, මුඛය හා ආමාශය. (4) මුඛය, ක්ෂුද්‍රාන්තය හා ග්‍රහණිය.
(5) ග්‍රහණිය, ක්ෂුද්‍රාන්තය හා ආමාශය.
(.......)

SPARK

6. දියවැඩියාව හා අධිරුධිර පීඩනයෙන් පෙළෙන රෝගියෙකු සඳහා වඩාත් සුදුසු ආහාර වර්ග දෙකකි.
(1) පළතුරු මිශ්‍ර කේක් කැබැල්ලක් හා මේද රහිත කිරි වීදුරුවක්.
(2) මේද අඩු චීස් කැබැල්ලක් හ තෙම්පරාදු කළ කොහිල ව්‍යංජනයක්.
(3) මිශ්‍ර එළවළු සලාදයක් හා මිරිසට පිසින කරවල කැබැල්ලක්.
(4) ඇඹුල් කෙසෙල් ගෙඩියක් හා රෝස්ට් කරන ලද මාළු කැබැල්ලක්.
(5) මිශ්‍ර පළතුරු කෝඩියල් වීදුරුවක් හා කුරක්කන් පාන් කැබැල්ලක්.
(.......)

17. යෝගට් නිෂ්පාදයේදී කිරිවලට "මුහුන්" එකතු කිරීමට හේතු වන්නේ,
(1) මිශ්‍ර කිරීමේ පහසුව සඳහා.
(2) සවිවරභාවයට.
(3) ආවේණික රස වෙනස් කිරීමට
(4) ශීතකරණයේ ක්‍රියාව හොඳින් සිදුවීම සඳහා.
(5) ක්ෂුද්‍රජීවීන් කිරිවලට එකතු කිරීම සඳහා.
(.......)

18. "පෙරුම්කායම්, රෝස්මරි, සැල්දිරි, සෝඩියම් නයිට්‍රේට්" ආකලන පිළිවෙලින් අයත් වන්නේ,
(1) මෘදු කාරක, සුවඳ කාරක, රස කාරක, පදම් කාරක
(2) පදම්කාරක, මෘදු කාරක, රස කාරක, සුවඳ කාරක
(3) මෘදු කාරක, සුවඳ කාරක, පදම් කාරක, රස කාරක
(4) සුවඳ කාරක, මෘදු කාරක, රස කාරක, පදම් කාරක
(5) රස කාරක, සුවඳ කාරක, මෘදු කාරක, පදම්කාරක
(.......)

19. බිත්තර කහ මදය මූලිකව යොදා ගනිමින් සකස් කරනු ලබන සලාද ඩ්‍රෙසිං වන්නේ,
(1) ප්‍රංශ සලාද වැස්ම.
(2) සවර් ක්‍රීම.
(3) පිසූ සලාද වැස්ම.
(4) මයෝනේස් සලාද වැස්ම.
(5) විනිග්‍රේට් සලාද වැස්ම.
(.......)

20. සුව්කරණයේ අරමුණක් නොවන්නේ,
(1) ආහාරයේ එන්සයිම අක්‍රිය වීම.
(2) අහාරයේ වර්ණය නොවෙනස්ව පවත්වා ගැනීම.
(3) ආහාරයේ ඇති සියළු ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීම.
(4) ආහාරයේ පරිමාව අඩුකිරීම.
(5) ඇසිරීමේ පහසුව.
(.......)

21. ආහාර ඇසිරීම පිණිස ගන්නා පොලිතින් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ඝනත්වය අඩු පොලිතින් තෙල් සහිත ආහාර ඇසිරීමට සුදුසුය.
(2) පොළි එතිලීන් ටෙරෆ්තලේට් නැවත නැවත භාවිත කළ හැකි පොලිතින් වර්ගයකි.
(3) ටෙට්‍රාපැක් ඇසුරුමේ පොලිතින් පටල තුනක් ඇත.
(4) ඝනත්වය වැඩි පොලිතින් ජලවාෂ්ප සඳහා පාරගම්‍යතාව වැඩිය.
(5) පොලිප්‍රොපිලීන් ශක්තිමත් නොවන ඇසුරුම් වර්ගයකි.
(.......)

22. හිතකර ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියා හේතුවෙන් ආහාර පරිරක්ෂිත ක්‍රමයක් වන්නේ,
(1) ශීත වියළීම.
(2) පැස්ටරීකරණය.
(3) පැසවීම.
(4) උපරිතාප ක්‍රමය.
(5) ජෑම් සෑදීම.
(.......)

23. "ප්‍රොපියොනේට්" නම් රසායනික සංයෝගය භාවිත කරනු ලබන්නේ,
(1) කිරි ආශ්‍රිත නිෂ්පාදන හා රස කැවිලි වලටය.
(2) මස් හා මිස් කර්මාන්තයටය.
(3) බේකරි නිෂ්පාදන සඳහාය.
(4) පැඟිරි කුලයේ පලතුරුවල මතුපිට තැවරීමටය.
(5) කෙසෙල් ඉක්මනින් ඉදවා ගැනීමටය.
(.......)

24. රෙදි පිළි හා ඇඟළුම් කර්මාන්තය පිළිබඳ ප්‍රකාශ කිපයක් පහත දැක්වේ.
A - යුරෝපා රටවල මිනිසුන්ට වඩාත් සුදුසු වන්නේ කපු රෙදිය.
B - පළමු වතාවට නිමි ඇඳුම් අපනයනය කරන ලද්දේ රුසියාවටය.
C - 1977 වර්ෂයේ නිමි ඇඳුම් කර්මාන්තය ශීඝ්‍ර දියුණුවක් කරා යොමු විය.
D - විසිවන සියවසේ පේෂකර්මය ඉතා දියුණු කලාවක් ලෙස නම් දරා තිබුණි.
ඉහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය.
(2) C හා D ය.
(3) B,C හා D ය.
(4) A, B හා D ය.
(5) B හා C පමණි.
(.......)

25. වැසුණු දම්වැල් මැස්ම අයත් වන මැහුම් වර්ගය වන්නේ,
(1) 600.
(2) 300.
(3) 400.
(4) 100.
(5) 500.
(.......)

TECNO SPARK

26. රෙදි වර්ගීකරණයට අනුව ස්වාභාවික රෙදි දක්වෙන්නේ,
(1) කපු, සිල්ක් , ස්පැන්ඩෙක්ස්.
(2) ස්පැන්ඩෙක්ස්, ලිනන් රේයෝන්
(3) කපු, සිල්ක් , ලිනන්.
(4) පොලියෙස්ටර්, කපු, සිල්ක්
(5) නයිලෝන්, ලිනන්, සිල්ක් (.......)

27. පිළිස්සීම මගින් රෙදි හඳුනා ගැනීමේදී සැර ගඳක් දීමින, ඇඟිලි අතුරුලින් පොඩිකළ නොහැකි තද පබළු අලු දක්නට ලැබේ. මෙම රෙදි වර්ගය වන්නේ,
(1) ලිනන් (2) සේද (3) ලෝම. (4) කපු (5) නයිලෝන්. (.......)

28. රෙද්දක් මර්සර කිරීමෙන් ලැබෙන වාසියක් නොවන්නේ ,
(1) රෙද්දේ ඔපය හා සිනිඳු බව වැඩිවීම.
(2) රෙද්දට සුදු පැහැයක් ලැබීම.
(3) රෙද්දට ශක්තිමත් බවක් ලැබීම.
(4) රෙදිවල හැකිලීම, ස්ථායිතාව වැඩිවීම.
(5) ඒකාකාරීව වර්ණ පෙවීම ගැනීමට හැකිවීම. (.......)

29. ලෝම රෙදි මලහරණය සඳහා යොදාගනු ලබන්නේ,
(1) හයිඩ්‍රොක්ලෝරික් අම්ලය.
(2) සල්ෆියුරික් අම්ලය.
(3) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්.
(4) සෝඩියම් කාබනේට් ය.
(5) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්ය. (.......)

30. බතික් කිරීමේ මූලික පියවර වන්නේ,
(1) කැද හරණය.
(2) මෝස්තරය සටහන් කිරීම.
(3) ජලිත් කිරීම.
(4) දුව ඉටි ආලේප කිරීම.
(5) පළමු වර්ණයෙන් වර්ණ ගැන්වීම. (.......)

31. කෙටි සායේ ඉණ මසා නිම කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
(1) දික් ගැස්වූ විවරය යෙදීම.
(2) මුහුණතල වාටියක් යෙදීම.
(3) පෝරු වාටියක් යෙදීම.
(4) සන්නාලි වාටිය යෙදීම.
(5) බඳන වාටිය යෙදීම. (.......)

32. අන්තර් පුද්ගල කුසලතා වර්ධනය කර ගැනීමට වැදගත්වන කුසලතාවක් වනුයේ,
(1) විශ්වාසය හා ප්‍රියමනාප බව.
(2) ඇහුම්කන් දීම.
(3) ගැටළු විසඳා ගැනීම.
(4) නිවැරදි සන්නිවේදනය.
(5) සාමූහික බව. (.......)

33. විවේක ක්‍රියාකාරකම් වලට අයත් නොවන ක්‍රියාකාරකම්,
(1) චිත්‍ර ඇඳීම, වෙස් ක්‍රීඩාවේ යෙදීම.
(2) ගෙවතුවගාව, විඩියෝ ක්‍රීඩාවල යෙදීම.
(3) සාප්පු සවාරි, චිත්‍රපට බැලීම.
(4) සංගීතය ශ්‍රවණය, සංගීත භාණ්ඩ වාදනය.
(5) අධ්‍යාපන කටයුතුවල හා ව්‍යාපාර කටයුතුවල යෙදීම. (.......)

34. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සිදුවන සංචරණය වනුයේ,
(1) කලාපාන්තර සංචරණයයි.
(2) බාහිර යොමු ගත සංචරණයයි.
(3) කලාප සංචරණයයි.
(4) අභ්‍යන්තර යොමුගත සංචරණය යි.
(5) ජාතික සංචරණය යි. (.......)

35. පහත කරුණු අතරින් සංචරණය මගින් සමාජයට ලැබෙන ප්‍රතිලාභ වන්නේ,
A - රජයට අමතර බදු ආදායම් ලැබීම.
B - මානසික හා ශාරීරික සෞඛ්‍ය ආරක්ෂා කරගත හැකිවීම.
C - සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම.
D - ශක්තිමත් සමාජ කණ්ඩායම් ගොඩනැගීම.
(1) A,C හා D
(2) B ,C හා D ය.
(3) A,C හා B ය.
(4) A හා B පමණි.
(5) C හා D පමණි. (.......)

36. සංචාරක කර්මාන්තයේ නව ප්‍රවනතා පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ධනවතුන් විශ්‍රාමාන්විත සංචාර කෙරෙහි යොමුවීම.
(2) තම රටට ආසන්න රටවල සංචාරයට වැඩි කැමැත්තක් නොදැක්වීම.
(3) ජනප්‍රිය ස්ථානවලට වඩා අප්‍රසිද්ධ සුවිශේෂ ස්ථාන කරා යොමුවීමේ කැමැත්ත.
(4) ලාභදායී ගුවන් ගමන් භාවිතයට පෙළඹීම.
(5) විවිධ රාජකාරී වලින් සම්පූර්ණයෙන් බැහැර වී විවේකය ගත කිරීමට ඇති කැමැත්ත වර්ධනය වීම. (.......)

37. ජලයේ පවතින රෝග කාරක බැක්ටීරියා විශේෂයක් වන්නේ,
(1) සැල්මොනෙල්ලාටයිෆි
(2) ෂිගෙල්ලා.
(3) ක්ලොස්ට්‍රීඩියම්.
(4) ඊකොලයි.
(5) හෙලිකොබැක්ටර් පයිලෝරි. (.......)

විද්‍යුත් ශක්තිය ආලෝක ශක්තිය බවටත් , තාප ශක්තිය බවටත්, යාන්ත්‍රික ශක්තිය බවටත් පත් කරන උපකරණ පිළිවෙලින් ඇති වරණය වනුයේ,
(1) විදුලි පහන, විදුලි උඳුන,බලෙන්ඩරය.
(2) බලෙන්ඩරය, විදුලි පංකාව, විදුලි උඳුන.
(3) විදුලි පංකාව, විදුලි උඳුන, බලෙන්ඩරය.
(4) විදුලි උඳුන, විදුලි පංකාව, බලෙන්ඩරය.
(5) බලෙන්ඩරය, විදුලි උඳුන, විදුලි පංකාව
(.......)

39. සැපයුම් අධිකාරිය සතු උපාංගයක් වන්නේ,
(1) සිහිනි පරිපථ බිඳිනය
(2) වෙන්කරණය.
(3) ප්‍රධාන වෙන්කරණය.
(4) ශේෂධාරා පරිපථ බිඳිනය.
(5) කෙවෙනි පිටුවාන.
(.......)

40. වඩාත් වාසිදායක වන පහන් වර්ගය වන්නේ,
(1) සූත්‍රිකා බල්බය.
(2) සුසංහිත බල්බය.
(3) ප්‍රතිදීප්ත බල්බය.
(4) තාප දීප්ත බල්බය.
(5) LED බල්බය.
(.......)

41. පුනර්ජනනීය නොවන සම්පතක් වන්නේ,
(1) හිරු එළිය.
(2) ඔක්සිජන් වායුව.
(3) සුළං.
(4) ශාක ගහනය.
(5) ලෝහමය ඛනිජ.
(.......)

42. දී ඇති ආහාර අතරින් ආහාර පා සලකුණු අඩුම ආහාරය කුමක්ද?
(1) ගොටුකොළ. (2) කිරි. (3) ගවමස්. (4) මාළු. (5) ධාන්‍ය. (.......)

43. රුධිර පීඩනය වළක්වා ගැනීමට උදවුවන ආහාරයකි.
(1) කිරි. (2) ඕට්ස්. (3) කළු හිනටි. (4) කැරට්. (5) බිත්තර (.......)

44. උපද්‍රවකාරී අපද්‍රව්‍යයක් වන්නේ,
(1) මුළුතැන් ගෙයි අපද්‍රව්‍ය.
(2) ගෙවත්තේ කොළරොඩු.
(3) කෘෂිකාර්මික අපද්‍රව්‍ය.
(4) නාගරික අපද්‍රව්‍ය වලටය.
(5) කාර්මික අපද්‍රව්‍ය.
(.......)

45. නව යොවුන් වියේ චිත්තවේග වර්ධනයේ ස්භාවයක් නොවන්නේ,
(1) චිත්තවේග කැළඹිලි ස්භාවයක් ගැනීමය.
(2) චිත්තවේග අසමතුලිතතා ඇරඹීමය.
(3) චිත්තවේග පාලනය කිරීමෙ හැකියාව නිසා දෙමවපියන් සමඟ ගැටළු ඇති නොවීමය.
(4) විටෙක ළමා වියේදී හා විටෙක වැඩිහිටි වියේ ගති ලක්ෂණ පෙන්වීමය.
(5) යොවුන් වියේදී චිත්තවේගික වශයෙන් පෙන්වන පරිණතිය මන්දගාමී වේ.
(.......)

46. යොවුන් වියේ දරුවන් තුළ දක්නට ලැබෙන ගැටළුමය තත්ත්වයකි "හීනමානය" මෙබඳු දරුවකු තුළ ඇති ලක්ෂණයක් වන්නේ,
(1) කැපී පෙනීමට උත්සහ කිරීම.
(2) හුදකලා වීමට කැමති බව.
(3) සමවයස් කණ්ඩායම් ඇසුරට කැමතිවීම.
(4) දෙමාපියන් නොපිළිගැනීම.
(5) බාහිර අලංකරණය ගැන වැඩි අවධානයක් යොමු කිරීම.
(.......)

47. යොවුන් වියේ දරුවන් තුළ ඇතිවන මානසික පීඩනය චිත්තවේගීව පෙන්නුම් කරන ආකාරය වන්නේ,
(1) වෙව්ලීම.
(2) කෑම අරුචිය.
(3) පපුව රිදීම
(4) ද්වේෂය.
(5) අලසබව.
(.......)

48. ආරයෙන්, පරිසරයෙන් අන්‍යෝන්‍ය බලපෑම නිසා ඇති වන ප්‍රතිඵලයකි.
(1) පෞරුෂය.
(2) ස්වසංකල්පය.
(3) ස්වාභිමානය.
(4) සංකාසනය.
(5) පරිකල්පණය.
(........)

49. රස කැවිලි නිෂ්පාදන ආයතනයක ශද්‍රඅත විශ්ලේෂණයක දී සලකා බලන තර්ජනයක් වන්නේ,
(1) කාලය කළමනාකරණය.
(2) ප්‍රවාහන පහසුකම්.
(3) පාරිභෝගික රුචිය.
(4) පෞද්ගලික කටයුතු අධික වීම.
(5) මහා පරිමාණ ව්‍යාපාර.
(.......)

50. "මැක්ලෙලන්ට" අනුව ව්‍යවසායකයන් තුළ පවතින ප්‍රධාන පෙළඹීමක් වන්නේ,
(1) බලය ලබා ගැනීමට පෙළඹවීම.
(2) නිෂ්පාදන අලෙවිකරණය සඳහා පෙළඹවීම.
(3) ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීම සඳහා පෙළඹවීම.
(4) නිෂ්පාදන නවීකරණය සඳහා පෙළඹවීම.
(5) [illegible] ය සඳහා පෙළඹවීම.
(........)